කොන්ක්‍රීට් යනු සිමෙන්ති, වැලි, ගල් සහ ජලයෙහි තද බවට පත් වූ මිශ්‍රණයකි. වෙරගැන්වූ කොන්ක්‍රීට් (Reinforced concrete) ව්‍යුහයන් යනු කොන්ක්‍රීට් සහ වානේ කම්බි කුරුවලින් සමන්විත ව්‍යුහයන් ය. වානේ සහ කොන්ක්‍රීට් වැනි සියලු ම දෘඪ වස්තූන් යම්තාක් දුරකට ප්‍රත්‍යාස්ථ වේ. කොන්ක්‍රීට් සම්පීඩනය යටතේ දී ශක්තිමත් වුවත් විතතිය යටතේ දී **දුර්වල** වන අතර, වානේ මෙම අවස්ථා දෙකම යටතේ දී ශක්තිමත් ය. සංයුක්තයක් ලෙස ප්‍රධාන වශයෙන් කොන්ක්‍රීට් සම්පීඩනයට ප්‍රතිරෝධී වන අතර ප්‍රධාන වශයෙන් වානේ කම්බි කුරු ආතතිය දරාගනී.

1 (a) රූපයේ පෙන්වා ඇති පරිදි W භාරයකට යටත්ව, ආධාරක දෙකක් මත තබා ඇති වානේ කම්බි කුරු **නොමැති** සෘජුකෝණාස්‍රාකාර හරස්කඩකින් යුත් සාමාන්‍ය කොන්ක්‍රීට් බාල්කයක් සලකන්න. මෙම තත්ත්වය යටතේ තිත් ඉරි මගින් පෙන්වා ඇති පරිදි බාල්කයේ පහළ කොටස විතතියක් අත්දකින අතර ඉහළ කොටස සම්පීඩනයක් අත්දකී.



1 (a) රූපය

a) (i) W භාරය යටතේ, සාමාන්‍ය කොන්ක්‍රීට් බාල්කයේ ඉරිතැලීමට වඩාත්ම ඉඩ ඇත්තේ කුමන (උඩ හෝ යට) පැත්ත ද?

(ii) 1 (a) රූපයේ පෙන්වා ඇති තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා 1 (b) රූපයේ පෙන්වා ඇති පරිදි, කොන්ක්‍රීට් නිෂ්පාදන අවස්ථාවේ දී වානේ කම්බි කුරු කොන්ක්‍රීට් බාල්කයේ පතුලට ආසන්නයෙන් ඇතුළත් කරනු ලබයි. මෙමගින් කොන්ක්‍රීට් බාල්කයේ භාර දරාගැනීමේ හැකියාව වැඩිදියුණු වී ඉරිතැලීම වැළැක්වෙනුයේ කෙසේ දැයි මෙම ප්‍රශ්නය ආරම්භයේ දී ඇති තොරතුරු උපයෝගී කරගනිමින් පැහැදිලි කරන්න.



1 (b) රූපය

b) මෘදු වානේ (S) සඳහා ආතන්‍ය ප්‍රත්‍යාබලය $\left(\frac{F}{A}\right)_S$ - විකෘතිය $\left(\frac{\Delta l}{l}\right)_S$ අතර සම්බන්ධය 2 (a) රූපයේ පෙන්වා ඇති පරිදි ආදර්ශනය කළ හැකි ය. කොන්ක්‍රීට් පහසුවෙන් කැඩෙන සුළු (භංගුර) ද්‍රව්‍යයක් වුව ද, **ආතන්‍ය බලයක් යටතේ** කොන්ක්‍රීට්වල (C) ආතන්‍ය ප්‍රත්‍යාබලය $\left(\frac{F}{A}\right)_C$ - විකෘතිය $\left(\frac{\Delta l}{l}\right)_C$ අතර සම්බන්ධය 2 (b) රූපයේ පෙන්වා ඇති පරිදි ආදර්ශනය කළ හැකි ය. වෙරගැන්වූ කොන්ක්‍රීට්වල වානේ කම්බි කුරු කොන්ක්‍රීට්වලට ඉතා හොඳින් බැඳී ඇති අතර, කොන්ක්‍රීට් පළුදු වන තුරු ඒවා එකට බැඳී බාහිර භාරයන්වලට ප්‍රතිරෝධය දක්වයි. 2 (b) රූපයේ පෙන්වා ඇති වක්‍රය P ලක්ෂ්‍යයට පැමිණි විට **කොන්ක්‍රීට් පළුදු වේ.**



2 (a) රූපය



2 (b) රූපය

2 (a) සහ 2 (b) රූප භාවිත කරමින්

(i) මෘදු වානේවල යංමාපාංකය E_S ගණනය කරන්න.

(ii) කොන්ක්‍රීට්වල යංමාපාංකය E_C ගණනය කරන්න.